ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1984 අංක 4 දරන පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1984 ජනවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල: ශත 90 යි. තැපැල් ගාස්තුව: ශත 60 යි.

## 1984 අංක 4 දරන පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පනත

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

එල්.ඩී.—ඕ. 124/78

**පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 4 දරන පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

### I වන කොටස

### පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පිහිටුවීම

**පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පිහිටුවීම.**

2. (1) (මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය යනුවෙන් හඳුන්වනු ලබන මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය යුතු අතර 6 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සහ මධ්‍යස්ථානයේ සාමාජිකයන් ලෙස පාලක මණ්ඩලය විසින් කලින් කල ඇතුළත් කරනු ලැබිය හැකි වෙනත් තැනැත්තන් සංඛ්‍යාවකගෙන් ද එය සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් මධ්‍යස්ථානයට පවරා දෙන ලද නමින්, මධ්‍යස්ථානය සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද එහි සංස්ථා නාමයෙන් මධ්‍යස්ථානය විසින් නඩු පැවරීම සහ මධ්‍යස්ථානයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

**මධ්‍යස්ථානයේ අරමුණු සහ කර්තව්‍ය.**

3. මධ්‍යස්ථානය පිහිටුවනු ලබන්නේ යම් අරමුණු සඳහා ද ඒ අරමුණු, පේෂකර්මාන්තය තුළ කාර්මික ක්‍රියාවලි සහ කළමනාකරණ කෞශල්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සහ විශේෂයෙන්,—

(අ) පේෂකර්ම පර්යේෂණය නගා සිටුවීම, එයට ආධාර කිරීම, අනුබල දීම සහ සහයෝගය දීම ;

(ආ) පේෂකර්ම අංශයෙහි කාර්මික ඒකකවලට තාක්ෂණික සහ ආර්ථික උපදේශක සේවා සැලසීමට ඉදිරිපත් වීම ;

(ඇ) පේෂකර්මාන්තයේ සංවර්ධනය කෙරෙහි බලපාන ආයතනික සාධක සම්බන්ධයෙන් විමර්ශන කිරීම් සහ පර්යේෂණ කර ගෙන යාම ;

(ඈ) පේෂකර්මාන්තය සහ පේෂකර්ම නිෂ්පාදන අධ්‍යයන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පුහුණුවීමේ පහසුකම් සහ පුහුණුවීමේ වැඩමාලා සැපයීමෙන් හෝ ක්‍රියාවේ යෙදවීමෙන් සේවකයින්ගේ සහ විධායක නිලධාරීන්ගේ වෘත්තීය හැකියාව ප්‍රවර්ධනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් ඩිප්ලෝමා, උපාධි, ත්‍යාග සහ විශිෂ්ඨත්වයන් ප්‍රදානය කිරීම ;

(ඉ) පේෂකර්ම පර්යේෂණ සහ පුහුණුවීම් සම්බන්ධ සම්මේලන හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා පැවැත්වීම සහ සඟරා හා කලාප පළ කිරීම ;

ඒ 073867—7,475 (83/11)

(ඊ) අමාත්‍යවරයාගේ උපදෙස් සඳහා මධ්‍යස්ථානය වෙත යොමු කරවනු ලැබිය හැකි යම් කරුණක් පිළිබඳව උපදෙස් දීම;

(උ) පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි සමාන ස්වභාවයෙන් යුත් වෙනත් පර්යේෂණ ආයතන සමග සහයෝගයෙන් කට යුතු කිරීම සහ

(ඌ) පේෂ කර්මාන්ත ඒකකවල නිශ්චිත තාක්ෂණික ගැටලු අධ්‍යයනය කිරීම සහ අවශ්‍ය මග පෙන්වීම සහ උපදෙස් ලබා දීම

විය යුතු ය

මධ්‍යස්ථානයේ බලතල.

4. ස්වකීය අරමුණු හා කාර්ය ක්‍රියාවේ යෙදවීම පිණිස යුක්ති සහගත ලෙස අවශ්‍ය වන බලතල ආයතනයට තිබිය යුතු අතර විශේෂයෙන්—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් ආකාරයකින් අත් කර ගැනීම හා තබා ගැනීම, බද්දක් හෝ කුලියක් මත ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) පේෂ කර්මාන්තයට අදාළ ක්ෂේත්‍ර අභ්‍යාස මධ්‍යස්ථාන සහ නියාමක ව්‍යාපෘති අත් කර ගැනීම, පිහිටුවීම, ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මධ්‍යස්ථානයේ කාර්ය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ මධ්‍යස්ථානයේ කටයුතු වල කාර්යක්ෂම පැවැත්ම සඳහා උපකරණ, අරමුදල්, පිරිස් සහ වෙනත් යම් ආධාර ලබා ගැනීම;

(ඈ) පේෂ කර්මාන්තයේ සියලු අංශ පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, ඒවාට ආධාර කිරීම, ඒවා සම්බන්ධීකරණය කිරීම සහ ඒවා දිරි ගැන්වීම;

(ඉ) මධ්‍යස්ථානය විසින් කරනු ලැබූ යම් සේවා සඳහා ගාස්තු හෝ අය කිරීම් නියම කිරීම;

(ඊ) මධ්‍යස්ථානයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(උ) මධ්‍යස්ථානයේ සේවා නියුක්තයන් සඳහා අර්ථසාධක අරමුදල් පිහිටුවා පවත්වා ගෙන යාම සහ සුභසාධක සහ විනෝදාස්වාද පහසුකම් සැලසීම;

(ඌ) මධ්‍යස්ථානයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම;

(එ) මධ්‍යස්ථානයේ කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන කර්තව්‍ය මධ්‍යස්ථානයේ යම් සාමාජිකයකුට, අධ්‍යක්ෂවරයාට හෝ යම් සේවා නියුක්තයකුට පැවරීම;

(ඒ) පාලක මණ්ඩලයේ මතය අනුව, මධ්‍යස්ථානයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන විමර්ශන කිරීම සහ දත්ත වාර්තාගත කිරීම, පොත් සහ ලේඛන පරීක්ෂා කිරීම සහ ඒවායින් පිටපත් හෝ උධෘත ලබා ගැනීම යන කාර්ය සඳහා යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුවීම ; සහ

(ඔ) පාලක මණ්ඩලයේ මතය අනුව මධ්‍යස්ථානයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වන හෝ ආනුෂංගික වන වෙනත් සියලු දේ කිරීම

මධ්‍යස්ථානය විසින් කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයාගේ විධාන යටතේ මධ්‍යස්ථානය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

5. ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ස්වකීය අරමුණු ක්‍රියාවේ යෙදවීමේ දී මධ්‍යස්ථානය විසින් පේෂකර්මාන්තය සම්බන්ධයෙන් ආණ්ඩුවේ සාමාන්‍ය ප්‍රතිපත්තිය අනුව සහ ඒ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබූ යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන අනුව කටයුතු කළ යුතු ය.

පාලක මණ්ඩලයේ සංයුතිය.

6. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, එනම්—

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ; හෝ

(ii) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ වෙනත් යම් නිලධරයකු ;

(ආ) කර්මාන්ත හා විද්‍යා කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයකු ;

(ඇ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයකු ;

(ඈ) ඇඳුම් අපනයනය කරන්නන්ගේ සංගමයේ නියෝජිතයකු ;

(ඉ) කපු රෙදිපිළි නිෂ්පාදකයන්ගේ සංගමයේ නියෝජිතයකු ;

(ඊ) මේස් හා බැනියන් නිෂ්පාදකයන්ගේ සංගමයේ නියෝජිතයකු ;

(උ) රෙදිපිළි මුද්‍රණ සංගමයේ නියෝජිතයකු ;

(ඌ) අත් යන්ත්‍ර පේෂකර්මාන්තයේ නියෝජිතයකු ;

(එ) පේෂකර්ම ආයතනයේ සභාපති (ශ්‍රී ලංකා අංශය) ; සහ

(ඒ) වෙනත් සාමාජිකයන් තුන් දෙනකු

යන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් මධ්‍යස්ථානයට තිබිය යුතු ය.

සාමාජිකත්ව සට නුසුදුසු වීම.

7. (අ) තැනැත්තෙක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් වේ නම් හෝ මන්ත්‍රීවරයෙක් වුවහොත් ;

(ආ) තැනැත්තෙක් මධ්‍යස්ථානය විසින් හෝ එය වෙනුවෙන් එළඹෙන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් දරයි නම් හෝ බුක්ති විඳියි නම් ; හෝ

(ඇ) තැනැත්තකුට මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තම කර්තව්‍ය තමා විසින් ඉටු කිරීමේ දී ඊට හානි කර අන්දමින් බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත් නම්

ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස දිගට ම කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

සාමාජිකයන්ගේ ධූර කාලය.

8. සභාපතිවරයා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා වන අවස්ථාවක ඒ සභාපතිවරයා සහ 6 වන වගන්තියේ (එ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයා හැර මණ්ඩලයේ සෑම සාමාජිකයකුම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් තම ධූරය හිස් කළහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් විය යුතු ය.

සාමාජිකයන්ගේ මරණය, ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් ඉවත් කිරීම.

9. (1) මණ්ඩලයේ යම් සාමාජිකයකුට, අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියකින් ඕනෑම අවස්ථාවක, තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) මණ්ඩලයේ යම් සාමාජිකයකු ධූරයෙන් ඉවත් කිරීම අවස්ථෝචිත යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, ඔහු විසින් ඒ සඳහා හේතු නොදක්වා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ සාමාජිකයා ධූරයෙන් ඉවත් කළ හැකි අතර ඒ ඉවත් කිරීම, යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, යම් සාමාජිකයකු පත් කරන ලද්දේ යම් අමාත්‍යවරයකු විමසා ද ඒ අමාත්‍යවරයා හෝ යම් සාමාජිකයකු නම් කරන ලද්දේ යම් අධිකාරියක් විසින් ද, ඒ අධිකාරිය හෝ විමසීමෙන් හැර, කිසිම සාමාජිකයකු මේ උපවගන්තිය යටතේ ඉවත් කරනු නොලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් සාමාජිකයකු මිය ගිය අවස්ථාවේ දී හෝ ධූරය අත්හැර ගිය අවස්ථාවේ දී හෝ පෙරාතුව ම වූ උපවගන්තිවල විධිවිධාන යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවේ දී, 6 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයට ම, අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය. ඒ සාමාජිකයා වෙනුවෙන් පත් කරන ලද යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධූරය දැරිය යුතු ය.

(4) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ යම් කාලසීමාවක් තුළ දී තම ධුරයෙහි කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන්නේ නම්, 6 වන වගන්තියේ විධි විධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයට ම, අමාත්‍යවරයා විසින්, ඒ කාල සීමාව තුළ දී ඔහු වෙනුවට ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(5) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාපතිවරයා වන අවස්ථාවේ දී සභාපතිවරයාට ද 6 වන වගන්තියේ (එ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයාට ද මේ වගන්තියේ (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

**10.** මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය. පුරප්පාඩුවක හේතුවෙන් ක්‍රියා බලරහිත නොවන බව.

**11.** මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගිවීම සඳහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පාරිශ්‍රමිකයක්, මධ්‍යස්ථානයේ අරමුදලින්, මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය. මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**12.** මණ්ඩලයේ රැස්වීම් හා ඒ රැස්වීම් සඳහා ගණපූරණය සම්බන්ධයෙන් ද ඒ රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සඳහා ද, මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය. මණ්ඩලයේ රැස්වීම්.

**13.** (1) මණ්ඩලයේ බලතල සහ කාර්ය අතුරින් කිසිවක් මණ්ඩලයේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සාමාජිකයකුට හෝ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාට හෝ එහි යම් සේවා නියුක්තයකුට හෝ මණ්ඩලය විසින් පැවරිය හැකි ය. බලතල පැවරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල හෝ කාර්ය අතුරින් කිසිවක් පවරා දෙනු ලැබූ සභාපතිවරයා, වෙනත් සාමාජිකයා, අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා විසින්, එසේ පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය ඉටු කිරීම, මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කළ යුතු ය.

**14.** (1) අමාත්‍යවරයා විසින්, සභාපතිවරයාගේ අදහස් විමසා, 6 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයන් අතුරින් උප සභාපතිවරයකු පත් කළ හැකි ය. මණ්ඩලයේ උප සභාපතිවරයා.

(2) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැති විටක උප සභාපතිවරයා, මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර සභාපතිවරයා සහ උප සභාපතිවරයා යන දෙදෙනාම පැමිණ නොමැති විටක සභාපතිවරයා හෝ උප සභාපතිවරයා වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයා මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක දී, තීරණය කළ යුතු යම් කරුණක් පිළිබඳව පක්ෂ ඡන්ද සංඛ්‍යාව හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වුවහොත්, ඒ රැස්වීමේ මූලසුන දරන සාමාජිකයාට තම ඡන්දයට අතිරේකව, දෙවන හෝ තීරක ඡන්දයක් තිබිය යුතු ය.

මධ්‍යස්ථානයේ කටයුතු මණ්ඩලය විසින් පරිපාලනය කළ යුතු බව.

15. මණ්ඩලය විසින් මධ්‍යස්ථානයේ කටයුතු පරිපාලනය කිරීම, බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ රීති.

16. මධ්‍යස්ථානයේ සාමාජිකයන් ලෙස තැනැත්තන් ඇතුළත් කිරීම හා ලියාපදිංචි කිරීම සඳහා ද ඒ සාමාජිකයන්ගේ විනය පාලනය හා ඔවුන් සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ද මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය.

## II වන කොටස

### මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා, මධ්‍යස්ථානයේ වෙනත් නිලධරයන් හා සේවකයන් පත් කිරීම

මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා.

17. (1) මණ්ඩලයේ අදහස් විමසා, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් ව, මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂවරයකු පත් කළ යුතු අතර, ඔහු මධ්‍යස්ථානයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. අධ්‍යක්ෂවරයාගේ පාරිශ්‍රමිකය, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, තීරණය කළ යුතු ය.

(2) මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලබන බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම හා කිරීම අධ්‍යක්ෂවරයා විසින් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කළ හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන පත්වීම් සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල.

18. (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව—

(අ) මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, කාර්ය මණ්ඩලය පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම ;

(ආ) කාර්ය මණ්ඩලයේ වේතන, වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම සහ කොන්දේසි තීරණය කිරීම ; සහ

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ සහපත සඳහා අර්ථ සාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම

මණ්ඩලය විසින් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලුම කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන්, මේ පනත යටතේ මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් සහ රාජ්‍ය සංස්ථාවල සේවකයන් පත් කිරීම.

19. (1) රජයේ සේවයේ යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු මධ්‍යස්ථානය විසින් සේවයේ යොදවනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මධ්‍යස්ථානයට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ එකඟවීමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ හෝ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ එම පළාත් පාලන ආයතනය විසින් එකඟ වනු ලබන නියම හා කොන්දේසි මත ඒ සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා හෝ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ හා රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව

පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් අඛණ්ඩතාව පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය සහ රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟවනු ලබන නියම හා කොන්දේසි මත එම නිලධරයා හෝ සේවකයා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(7) (5) වන හෝ (6) වන උපවගන්තිය අනුව යම් තැනැත්තකු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් විය යුතු ය.

මධ්‍යස්ථානයේ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

20. මධ්‍යස්ථානයේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව, මධ්‍යස්ථානය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

21. මධ්‍යස්ථානය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛන ගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධි විධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

## III කොටස

## මුදල්

මධ්‍යස්ථානයේ ප්‍රාග්ධනය.

22. (1) මධ්‍යස්ථානයේ ආරම්භක ප්‍රාග්ධනය, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන නියම හා කොන්දේසි මත, ආණ්ඩුව විසින් මධ්‍යස්ථානයට සපයනු ලබන මුදල් ප්‍රමාණය විය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ලබා ගත් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මධ්‍යස්ථානය විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයකින් මධ්‍යස්ථානයේ ප්‍රාග්ධනය කලින් කල වැඩිකළ හැකි ය.

මධ්‍යස්ථානයේ අරමුදල.

23. (1) මධ්‍යස්ථානයට මධ්‍යස්ථානයේ ම අරමුදලක් තිබිය යුතු ය.

(2) මධ්‍යස්ථානයට ලැබෙන පහත දැක්වෙන මුදල්, අරමුදලට ගෙවනු ලැබිය යුතු ය—

(අ) මේ පනත මගින් හෝ එය යටතේ හෝ ඒ අරමුදලට ගෙවනු ලැබීමට නියමිත ගෙවීම්;

(ආ) ලියාපදිංචි කිරීමේ දී සාමාජිකයන්ගෙන් එකතු කර ගන්නා ලද ගාස්තු; සහ

(ඇ) මධ්‍යස්ථානය විසින් සපයන ලද හෝ සලසන ලද සේවා සඳහා අය කරන ලද ගාස්තු.

(3) මධ්‍යස්ථානයේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා මධ්‍යස්ථානය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලුම මුදල් ප්‍රමාණයන් මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවිය යුතු ය.

මුදල් වර්ෂය.

24. මධ්‍යස්ථානයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

25. (1) මධ්‍යස්ථානයේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට මණ්ඩලය සැලැස්විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, මධ්‍යස්ථානයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

වාර්ෂික වාර්තාව.

26. මණ්ඩලය විසින්, මධ්‍යස්ථානයේ කටයුතුවල වාර්තාවක් වාර්ෂිකව පිළියෙල කළ යුතු ය.

මධ්‍යස්ථානය සඳහා, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

27. (1) මධ්‍යස්ථානයේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වූ විට සහ යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ විට, ඒ දේපළ අවශ්‍යව ඇත්තේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය පොදු කාර්යයක් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන මධ්‍යස්ථානයට පවරනු ලැබිය හැකි ය.

(2) මධ්‍යස්ථානය සඳහා යම් නිශ්චල දේපළක් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක්, මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු ය.

රජයේ චංචල සහ නිශ්චල දේපළ මධ්‍යස්ථානයට ලබාගත හැකි බව.

28. (1) රජයේ යම් නිශ්චල දේපළක් මධ්‍යස්ථානයේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දේපළ සම්බන්ධයෙන් මධ්‍යස්ථානය වෙත කරනු ලබන විශේෂ ප්‍රදානයකට හෝ දෙනු ලබන බද්දකට ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) රජයේ චංචල දේපළක් මධ්‍යස්ථානයේ කාර්යය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, එම දේපළ අයිති හෝ එම දේපළෙහි සන්තකය දරන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ කැමැත්ත ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින්, ඒ චංචල දේපළෙහි සන්තකය සහ පාවිච්චිය මධ්‍යස්ථානය වෙත පවරා සතු කර දිය හැකි ය.

මධ්‍යස්ථානයේ පාවිච්චිය සඳහා ස්ථාන ආදිය ආණ්ඩුව විසින් ලබා දිය යුතු බව.

**29.** මධ්‍යස්ථානයට අවශ්‍ය යයි සලකනු ලබන ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් මධ්‍යස්ථානයේ පාවිච්චිය සඳහා ආණ්ඩුව විසින් සැපයිය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධාන පිට ගන්නා ලද ක්‍රියා මාර්ගයක් සඳහා වූ ආරක්ෂාව.

**30.** (1) (අ) මේ පනත යටතේ මධ්‍යස්ථානය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මධ්‍යස්ථානයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි අදහස් කරන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මධ්‍යස්ථානයේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් දරනු ලැබූ යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යයි අධිකරණය විසින් තීරණය කරන්නේ නම්, මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මධ්‍යස්ථානයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට හෝ විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**31.** මධ්‍යස්ථානයට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී මධ්‍යස්ථානයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ රිට් ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුවීමට මණ්ඩලයට හෝ එහි යම් සාමාජිකයකුට හෝ මණ්ඩලයේ අධිකාරය යටතේ ක්‍රියා කරන යම් සේවා නියුක්තයකුට ඇති බලය.

**32.** පරීක්ෂා කිරීම, විමර්ශනය කිරීම සහ දත්ත වාර්තාගත කිරීම සඳහා මණ්ඩලය හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ මණ්ඩලයේ අධිකාරය යටතේ ක්‍රියා කරන මධ්‍යස්ථානයේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුවීම නීත්‍යානුකූල විය යුතු ය.

මණ්ඩලය හෝ යම් සාමාජිකයකු හෝ බලයලත් සේවා නියුක්තයකු වළක්වන හෝ මණ්ඩලයට හෝ ඔහුට බාධා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන බව.

**33.** 32 වන වගන්තියේ සඳහන් කොට ඇති පරිදි වූ එවැනි යම් ඇතුළුවීමක්, විමර්ශනය කිරීමක් හෝ පරීක්ෂා කිරීමක් ක්‍රියාත්මක කිරීමේ දී මණ්ඩලය හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු හෝ වළක්වන නැතහොත් මණ්ඩලයට හෝ ඒ සාමාජිකයාට හෝ නිලධරයාට හෝ සේවා නියුක්තයාට හෝ බාධා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

34. (1) මේ පනතේ 3 වන සහ 4 වන වගන්ති යටතේ, මධ්‍යස්ථානයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය අතුරින් යමක් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට මධ්‍යස්ථානයට හැකි වීමේ කාර්යය සඳහා පේෂ කර්මාන්තයෙහි දී භාවිතා කරනු ලබන හෝ භාවිතා කිරීමට අදහස් කරනු ලබන හෝ ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික යම් චංචල හෝ නිශ්චල දේපලකට අදාල යම් කරුණක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු දන්නා තොරතුරු, ඒ තැනැත්තා වෙත යවනු ලබන ලිඛිත දැන්වීමක නිශ්චිතව සඳහන් කාල සීමාව තුළ දී සපයන ලෙස, මණ්ඩලයේ සභාපතිවරයා, සාමාජිකයකු, ව්‍යවස්ථානයේ අධ්‍යක්ෂවරයා හෝ තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ යම් සේවා නියුක්තයකු විසින්, ඒ ලිඛිත දැන්වීම මගින්, ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

තොරතුරු ලබා ගැනීමට ඇති බලය.

(2) යම් තැනැත්තකු යම් නීතියක විධිවිධාන යටතේ යම් තොරතුරක් හෙළිකිරීමෙන් වළක්වනු ලැබ ඇති අවස්ථාවක දී හැර, (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමකින් යම් තොරතුරක් සපයන ලෙස ඉල්ලීමක් කරනු ලැබ ඇති තැනැත්තකු විසින් ඒ දැන්වීමෙහි සඳහන් කාලසීමාව තුළ දී ඒ නියමය අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය වන්නේ ය.

(3) සාධාරණ හේතුවක් නොමැතිව, (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ යම් තොරතුරක් අසත්‍ය බව දන දනම ඒ තොරතුරු සපයන හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

35. මේ පනත යටතේ වරදක් සිදු කරන සෑම තැනැත්තකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

වැරදි වලට දණ්ඩන.

36. මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් විශේෂ හෝ සාමාන්‍ය විධාන ලිඛිතව දිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන බලාත්මක කළ යුතු ය.

මණ්ඩලයට විශේෂ හෝ සාමාන්‍ය විධාන දීමට අමාත්‍යවරයාට ඇති බලය.

37. (1) මේ පනතින් රීති සාදනු ලැබීමට බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් හෝ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය.

රීති සෑදීමට මණ්ඩලයට ඇති බලය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, පැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.